# 5 ශ්‍රේණිය සිංහල 2022

## ගුරු අත් පොතට වැඩ පොත අංක 01

### L 1, S 1 නිපුණතා ආවරණය



- **අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.**

  (පවසන දෙයකට සවන් දීම, කතන්දරවලට සවන් දීම, ළමා ගීතවලට සවන් දීම, ළමා කවිවලට සවන් දීම)

- **අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.**

  (නිදහසේ කතන්දර පැවසීම, මාතෘකාවකට අදාළ ව කතා කිරීම)


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

(Dip. In Sci. N.I.E./O.U.S.L.)



Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 5 ශ්‍රේණිය මව්බස (සිංහල)
## $L_1$ $S_1$ ඉගෙනුම් පල

- පවසන දෙයකට සවන් දී අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙයි.
- කතන්දරයක් ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට අවබෝධයෙන් යුතු ව ප්‍රතිචාර දක්වයි.
- කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ තම අදහස් ප්‍රකාශ කරයි.
- ළමා කවි, ගීතවලට සවන් දෙමින් තාල තබයි.
- ළමා කවි, ගීතවලට සවන් දෙමින් ගායනා කරයි.
- සිද්ධි ගළපමින් නිර්මාණාත්මක ලෙස කතන්දරයක් ඉදිරිපත් කරයි.
- මාතෘකාවකට අදාළ ව කතා කිරීමට නොපැකිළ ව ඉදිරිපත් වෙයි.
- මාතෘකාවකට අදාළ ව නිවැරදි ව කතා කරයි.

### පවසන දෙයකට සවන් දීම

01. පහත සඳහන් ඡේදයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

සැම ගෙයක් ම ගෙවත්තකින් යුක්ත ය. අක්කරයක් දෙකක් තරම් විශාල ගෙවත්ත හතර වටේ ම පැළ ඉනි වැටකි. ගේ ඉදිරි පසින් වැටෙන් ඇතුළු වීමට සෑදූ කඩුල්ලකි.

ගෙවතු දෙහි, දොඩම් හා මඤ්ඤොක්කා යන වගාවන්ගෙන් යුක්ත ය. කෝං, මාදං, සියඹලා, බුරුත, වෑවරන, මිල්ල වැනි විශාල ගස් එකක් දෙකක් හෝ නැති ඉඩමක් දැකිය නොහැකි ය. මයිල ගසක් හෝ කිහිපයක් සැම ඉඩමක ම වෙයි. කපා බිම හෙළන ලද විශාල ගස්වල කඳන් පිලිස්සී ඉතුරු වූ කොටස් මේ ඉඩම්වල සුලබ ය. . . .

හැම ඉඩමක ම ලබු වැලක් දෙකක් අනිවාර්යයෙන් දකින්නට ලැබේ. දිය ගෙන ඒමට ගන්නා භාජනය වශයෙන් හා බීජ සඳහා ගන්නා ධාන්‍ය තැන්පත් කර තැබීමට ලබුකැට භාවිත වේ. මේ නිසා බින්තැන්නේ ජන ජීවිතයට ලබු වැල නැතුව ම බැරි දෙයකි.

වනගත චාරිකා, පියසේන කහඳගමගේ.

1. ගෙවත්ත වටේට ඇත්තේ කුමක් ද ?

....................................................................................................................................

2. ගේ ඉදිරිපස වැටෙන් ඇතුළු වීමට සාදා ඇත්තේ කුමක් ද ?

....................................................................................................................................

3. ගෙවත්තේ ඇති වගාවන් මොනවා ද ?

....................................................................................................................................

4. ගෙවත්තේ ඇති විශාල ගස් වර්ග තුනක් පවසන්න.

....................................................................................................................................

5. හැම ඉඩමක ම අනිවාර්යයෙන් දකින්නට ලැබෙන්නේ මොනවා ද ?

....................................................................................................................................

6. බින්තැන්නේ ජන ජීවිතයට ලබු වැල නැතුව ම බැරි දෙයක් වන්නේ ඇයි?

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

## කතන්දරවලට සවන් දීම

02. පහත සඳහන් කතන්දරයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

නිපුණ දම්සර වන මම ගමේ පාසලේ හය වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙක් වෙමි. මාගේ නංගී නිපුණි දම්සාරි ද මාගේ පාසලේ ම පස් වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නී ය. මාගේ තාත්තා ගල් වැඩපළක රැකියාව කරන අතර අම්මා ඉඳිආප්ප සාදා විකුණා ගෙදර වියදම පිරිමසා ගැනීමට උත්සාහ ගනියි.

"මම මේ තරම් මහන්සි වෙන්නේ අපේ දරුවෝ දෙන්නාගේ ජීවිත මීට වඩා ලස්සන කරන්න ඕනෑ නිසා යි. හොඳට ඉගෙන ගත්තොත් අපි වාගේ මෙහෙම දුක් විඳින්න ඕනෙ නැහැ නේ." තාත්තා සැම විටක ම වාගේ අම්මා සමඟ පවසනු මට ඇසී තිබේ.

"ඒ දෙන්නත් ඒ ගැන තේරුම් අරගෙනයි ඉන්නේ. ඒකනේ මහන්සි වෙලා පාඩම් වැඩ කරන්නේ." අම්මා තාත්තා අස්වසයි. කුක්කු . . . කූ . . . කූ . . . නාදය පරිසරයට මුසුවනවාත් සමඟ ම අම්මා ගෙදර ළිප එළිය කරන්නේ අප සැමගේ ම සිත් එළිය කරන්නට මෙනි. අනතුරු ව අම්මා ඉඳිආප්ප සාදයි. මම එසැනින් ම අවදි වී චිමිනි ලාම්පුව දල්වා ගෙන පාඩම් කරමි. තාත්තා බොහෝ විට අම්මාට උදවු කිරීම සඳහා අවදි වුවත් අම්මා තාත්තාට පවසන්නේ ගල් වැඩපළේ මහන්සි වී වැඩ කරන නිසා විවේක ගන්නා ලෙස ය. නංගී ද අවදි වී පාඩම් කර අම්මා අසලින් වාඩි වෙයි. අම්මා ඉඳිආප්ප තට්ටුවලින් ගලවා වට්ටියකට දමයි. නංගී ඒවා ගණන් කර කඩවලට ලබා දීම සඳහා වෙන වෙන ම කූඩවල අසුරයි.

උදෑසනින් ම පාසල් යෑම සඳහා සූදානම් වන නංගීත් මමත් බොහෝ විට උදේ ආහාරය සඳහා හීල්බත් කන්නෙමු. 'හීල්බත්' යනු පෙර දින රැයේ පිසූ බත් ය. අපේ ගෙදර ආහාර නාස්ති වනු මා දැක නැත. හීල්බත් නොතිබුණු විටෙක අම්මා සාදන ඉඳිආප්ප පොල් සම්බල සමඟ කන්නෙමු.

දින පතා ම වාගේ පාසල අසල කඩයට ඉඳිආප්ප කූඩය දී යන්නේ මා විසිනි. තාත්තා ගල් වැඩපළට යන විට අනෙක් කඩවලට ඉඳිආප්ප බෙදා දෙයි.

පාසලේ ශිෂ්‍ය නායකයෙකු වන මම ඒ වගකීම් ද නොපිරිහෙළා ඉටු කරමි. මම ඉගෙනීම් කටයුතු හොඳින් සිදු කරන නිසා නංගී ද ඇයගේ ඉගෙනීම් කටයුතු සාර්ථක ව කර ගැනීමට වෙහෙසෙයි.

අම්මා සහ තාත්තා ඉතා දුක් මහන්සියෙන් අප ජීවත් කර වීමට ගන්නා වෙහෙස අපි දනිමු. ඒ නිසා හොඳින් ඉගෙන ගෙන හොඳ රැකියාවක් කිරීම අප දෙදෙනාගේ ම බලාපොරොත්තුවයි. පාසලේ ගුරුවරු ද සැම විට ම අප දෙදෙනා අගය කරති. සැම වසරක ම වාගේ වාර විභාගවල දී නංගීත් මමත් පන්තියේ පළමුවෙනියා වන්නෙමු. ඒ ගැන අම්මාට සහ තාත්තාට ඇත්තේ මහත් වූ ආඩම්බරයකි.

අම්මාගේ ගෙදර දොර සකසුරුවම වෙසෙසින් ම අගය කළ යුත්තකි. උදෑසන ඉඳිආප්ප සාදන අම්මා අප සැම නිවසින් පිටත් වූ පසු ගෙදර දොර කටයුතු නිම කර එළවළු වගා කරයි. ගෙදරට අවශ්‍ය එළවළු ගෙවත්තෙන් ම සපයා ගැනීමට වෙහෙස දරන ඇය දඹල, වම්බටු, වට්ටක්කා, මෑකරල් ආදිය වගා කරයි. අපට අවශ්‍ය කොටස තබාගෙන ඉතුරු ඒවා කඩයට දී අමතර ආදායමක් ද ලබා ගනියි. දින පතා ම වාගේ එළවළු පාත්තිවලට වතුර දමන්නේ මා යි. නංගී කුස්සියේ උයන පිහින වැඩ සඳහා අම්මාට උදවු වෙයි. ගල් වැඩපළේ වැඩ නිම කර තාත්තා නිවසට ගොඩ වෙන්නේ බිම් කරුවල වැටෙන විට ය. ගල් කඩන මිටියට තාත්තාගේ අත්වල කරගැට එයි. කුප්පි ලාම්පුව තබා ගෙන අම්මා, තාත්තාගේ අත්වල තෙල් ගාන අවස්ථා මම දැක ඇත්තෙමි. ඒ සැම විටක දීත් මම කෙසේ හෝ තවත් උනන්දුවෙන් පාඩම් වැඩ කර ජීවිතය ජයගත යුතු බවට අදිටන් කර ගත්තෙමි.

වසර කිහිපයක් ගත විය. මම අ.පො.ස. (සා.පෙ.) විභාගයට මුහුණ දුන්නෙමි. මාස කිහිපයකින් පසු ව විභාග ප්‍රතිඵල නිකුත් විය. මා සැම විෂයයකට ම විශිෂ්ට සාමාර්ථ ලබා ගෙන විභාගය ඉතා උසස් ලෙස සමත් වී තිබුණි. මා හට සතුට දරාගත නොහැකි තරම් ය. විදුහල්පතිතුමා පාසලේ උදෑසන රැස්වීමේ දී "නිපුණගේ මනා කැපවීම, උනන්දුව සහ ඉතා හොඳින් ඉගෙනීම් කටයුතුවල නිරත වීම නිසා මෙලෙස විශිෂ්ට ප්‍රතිඵලයක් ලැබුණු බවත්, පාසලට මෙවන් ප්‍රතිඵලයක් ලබා දුන් පළමුවෙනියා නිපුණ දම්සර බවත් ඒ හේතුවෙන් පාසලට ලබා දුන් කීර්තිය ඉතා වටිනා බවත්" ප්‍රකාශ කළේ ය.

අම්මාට සහ තාත්තාට ද එදින පාසලට පැමිණෙන ලෙසට දන්වා තිබුණි. විදුහල්පතිතුමා ගුරුවරු අම්මාටත් තාත්තාටත් ඔවුන්ගේ සතුට ප්‍රකාශ කර සුබ පැතූහ. ඒ දෙදෙනා ඒ සුබ පැතුම් පිළිගත්තේ දෑත් එක් කර ආචාර කිරීමෙනි.

අම්මාත් තාත්තාත් ගුරුවරුන්ට ආචාර කරන විට අම්මාගේ දෑසින් කඳුළු වැටෙනු මම දුටුවෙමි. ඒ සතුටු කඳුළු බව මම දන්නෙමි.

1. නිපුණ දම්සර ඉගෙන ගන්නේ කුමන ශ්‍රේණියේ ද ?

..............................................................................................................................................

2. අම්මා උදෑසන අවදි වී සිදු කරන්නේ කුමක් ද ?

..............................................................................................................................................

3. නිපුණ සහ නංගී හොඳින් ඉගෙන ගැනීමට උත්සාහ ගන්නේ ඇයි ?

..............................................................................................................................................

4. නිපුණ විභාගය සමත් වීමට හේතුව ලෙස විදුහල්පතිතුමා ප්‍රකාශ කළේ කුමක්ද ?

..............................................................................................................................................

## ළමා ගීතවලට සවන් දීම

03. පහත සඳහන් ගීතයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. ගුරුවරයා සමඟ සිසුන් තාල තබමින් ගීතය ගායනා කරන්න. මෙහි දී ගීතයට අනුව වින්දනාත්මක ප්‍රතිචාර දැක්වීමට සිසුන් යොමු කරන්න. උදා : අත්පුඩි ගැසීමෙන්/තාලම්පට භාවිතයෙන්/ ආදේශ භාණ්ඩ භාවිතයෙන්

ඈත මෑත සුවඳ දී සැලී
නේක නේක හැඩ රුවින් මැවී
පාට පාට මල් වගේ පිපී
යාළු යාළු පොඩි ළමයි අපි //

ල ල ල ලා . . . ////

උදෑසනක උදාගිරක අරුණ කිරණ අපි
කඩා හැලෙන දිය දහරක පිපෙන බුබුළු අපි
සදාහරිත තුරු ගොමුවක සලිත ළපලු අපි
පාට පාට මල් වගේ පිපී
යාළු යාළු පොඩි ළමයි අපි //

සඳ ඇති රැය මිහිර විඳින තරු පිරිවර අපි
දේදුන්නක පාට සදන තරු පිරිවර අපි
පාට පාට මල් වගේ පිපී
යාළු යාළු පොඩි ළමයි අපි //

ඈත මෑත . . .



පද රචනය : ආචාර්ය, සෝමරත්න දිසානායක

1. ගීතයෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද?

..............................................................................................................................................

2. ළමයින් උපමා කොට හෝ සමාන කර ඇති අවස්ථා උපුටා දක්වන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

# ළමා කවිවලට සවන් දීම

04. පහත සඳහන් කවි පෙළට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

ඉර උදා වෙන්න ට
පළමු ව නැඟිට සිහි කොට
අලසකම් දුරු කොට
කරන් වැඩපල දියුණු වන්නට

ගෙදොර අතු ගෑමෙන
මූණ කට සෝදා ගෙන
ඔළුව පීරා ගෙන
අකුරු පාඩම් කරනු සතුටින

අතපය සෝදා ගෙන
නරක කෑමක් නොම ගෙන
හොඳ දෙයක් කෑ මෙන
සැරසෙන්න පාසලට යන මෙන

තම දෙවියන් නැමද
මව්පිය දෙදෙන දැක වැඳ
ගුරුන් වෙත ගොස් වැඳ
අකුරු නිසි ලෙස ඉගෙන ගනු සොඳ

තම පොත්පත් රැගෙන
නියම තැන්වල ඉඳගෙන
ගෝසා නොකරමි න
කරනු පාඩම් සිතට ගනිමින

පාසලෙහි තැන තැන
නොයන් දුවමින් බලමින
දඟ නොකර ඉඳ ගෙන
ගුරුන් කී දෙය කරන් එලෙසින

අනුන්ගේ පොත් පත්
නාදිනු නොගනු කිසිවක්
උවමනා කළ හොත්
කියා ඉල්ලා ගැනුම යහපත්

සිඟා කාගෙන වත්
කිලුටු වැරහැලි ඇඳවත්
බිම වැටී ඉඳ වත්
මහත් සැප වෙයි ඉගෙන ගත හොත්

1. කවියේ සඳහන් හොඳ පුරුදු කිහිපයක් ලියන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

2. කවිය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

.......................................................................................................

3. එම ග්‍රන්ථය රචනා කර ඇත්තේ කවුරුන් විසින් ද?

.......................................................................................................

## නිදහසේ කතන්දර පැවසීම

05. පහත සිද්ධියෙන් පටන් ගෙන කුඩා කතන්දරයක් ගොඩ නඟන්න.

- විශාල කළුගල් ගොඩක් මිදුලේ පසෙකින් පෙනෙන්නට ඇත. ඒ අසලින් නයෙක් ඇදී යයි.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

## මාතෘකාවකට අදාළ ව කතා කිරීම

06. පහත එක් මාතෘකාවක් තෝරාගෙන මාතෘකාවට අදාළ ව කතාවක් කරන්න.

- මා කැමති ම කතා පොත
- රූපවාහිනිය
- වැඩිහිටියන්ට සලකමු
- මගේ ගෙවත්ත
- මා ගිය විනෝද ගමනක්

උදා : **මා කැමති ම පොත**

- මා කියවූ පොත් අතරින් මා වඩාත් ම කැමති ගඟ අද්දර කැලේ නම් පොතට යි.
- එහි කතුවරයා වන්නේ සෝමවීර සේනානායක මහතා යි.
- ගැමි පරිසරයක ජීවත් වන විට ලැබෙන බොහෝ අත්දැකීම් මේ කතා පොතේ ඇතුළත් කර තිබෙනවා.
- පහුරක ගිය ගමන, වැස්සි සහ පැටියා සොයා ගත් ආකාරය මගේ සිත් ගත් අවස්ථා යි.
- යහළුවන් සමඟ එකමුතුකමින් ජීවත් වීමේ වටිනාකම මෙම පොත කියවීමෙන් මට පැහැදිලි වුණා.

# පිළිතුරු



**Answer**

# 5 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_1$ $S_1$ ඉගෙනුම් පල

- පවසන දෙයකට සවන් දී අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙයි.
- කතන්දරයක් ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට අවබෝධයෙන් යුතු ව ප්‍රතිචාර දක්වයි.
- කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ තම අදහස් ප්‍රකාශ කරයි.
- ළමා කවි, ගීතවලට සවන් දෙමින් තාල තබයි.
- ළමා කවි, ගීතවලට සවන් දෙමින් ගායනා කරයි.
- සිද්ධි ගළපමින් නිර්මාණාත්මක ලෙස කතන්දරයක් ඉදිරිපත් කරයි.
- මාතෘකාවකට අදාළ ව කතා කිරීමට නොපැකිළ ව ඉදිරිපත් වෙයි.
- මාතෘකාවකට අදාළ ව නිවැරදි ව කතා කරයි.

## පවසන දෙයකට සවන් දීම

01. පහත සඳහන් ඡේදයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

සෑම ගෙයක් ම ගෙවත්තකින් යුක්ත ය. අක්කරයක් දෙකක් තරම් විශාල ගෙවත්ත හතර වටේ ම පැළ ඉනි වැටකි. ගේ ඉදිරි පසින් වැටෙන් ඇතුළු වීමට සෑදූ කඩුල්ලකි.

ගෙවතු දෙහි, දොඩම් හා මඤ්ඤොක්කා යන වගාවන්ගෙන් යුක්ත ය. කෝං, මාදං, සියඹලා, බුරුත, වෑවරන, මිල්ල වැනි විශාල ගස් එකක් දෙකක් හෝ නැති ඉඩමක් දැකිය නොහැකි ය. මයිල ගසක් හෝ කිහිපයක් සෑම ඉඩමක ම වෙයි. කපා බිම හෙළන ලද විශාල ගස්වල කඳන් පිලිස්සී ඉතුරු වූ කොටස් මේ ඉඩම්වල සුලබ ය. . . .

හැම ඉඩමක ම ලබු වැලක් දෙකක් අනිවාර්යයෙන් දකින්නට ලැබේ. දිය ගෙන ඒමට ගන්නා භාජනය වශයෙන් හා බීජ සඳහා ගන්නා ධාන්‍ය තැන්පත් කර තැබීමට ලබුකැට භාවිත වේ. මේ නිසා බින්තැන්නේ ජන ජීවිතයට ලබු වැල නැතුව ම බැරි දෙයකි.

වනගත චාරිකා, පියසේන කහඳගමගේ.

1. ගෙවත්ත වටේට ඇත්තේ කුමක් ද ?

.....පැළ ඉනි වැටක්.....

2. ගේ ඉදිරිපස වැටෙන් ඇතුළු වීමට සාදා ඇත්තේ කුමක් ද ?

.....කඩුල්ලක්.....

3. ගෙවත්තේ ඇති වගාවන් මොනවා ද ?

.....දෙහි, දොඩම් හා මඤ්ඤොක්කා යන වගාවන්.....

4. ගෙවත්තේ ඇති විශාල ගස් වර්ග තුනක් පවසන්න.

.....කෝං, මාදං, සියඹලා, බුරුත, වෑවරන, මිල්ල.....

5. හැම ඉඩමක ම අනිවාර්යයෙන් දකින්නට ලැබෙන්නේ මොනවා ද ?

.....ලබු වැලක් දෙකක්.....

6. බින්තැන්නේ ජන ජීවිතයට ලබු වැල නැතුව ම බැරි දෙයක් වන්නේ ඇයි?

.....දිය ගෙන ඒමට ගන්නා භාජනය වශයෙන් හා බීජ සඳහා ගන්නා ධාන්‍ය.....

.....තැන්පත් කර තැබීමට ලබුකැට භාවිත වන නිසා.....

.....................................................................................

# කතන්දරවලට සවන් දීම

02. පහත සඳහන් කතන්දරයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

නිපුණ දම්සර වන මම ගමේ පාසලේ හය වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙක් වෙමි. මාගේ නංගී නිපුණි දම්සාරි ද මාගේ පාසලේ ම පස් වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නී ය. මාගේ තාත්තා ගල් වැඩපළක රැකියාව කරන අතර අම්මා ඉඳිආප්ප සාදා විකුණා ගෙදර වියදම පිරිමසා ගැනීමට උත්සාහ ගනියි.

"මම මේ තරම් මහන්සි වෙන්නේ අපේ දරුවෝ දෙන්නාගේ ජීවිත මීට වඩා ලස්සන කරන්න ඕනෑ නිසා යි. හොඳට ඉගෙන ගත්තොත් අපි වාගේ මෙහෙම දුක් විඳින්න ඕනෙ නැහැ නේ." තාත්තා සැම විටක ම වාගේ අම්මා සමග පවසනු මට ඇසී තිබේ.

"ඒ දෙන්නත් ඒ ගැන තේරුම් අරගෙනයි ඉන්නේ. ඒකනේ මහන්සි වෙලා පාඩම් වැඩ කරන්නේ." අම්මා තාත්තා අස්වසයි. කුක්කු . . . කූ . . . කූ . . . නාදය පරිසරයට මුසුවනවාත් සමග ම අම්මා ගෙදර ළිප එළිය කරන්නේ අප සැමගේ ම සිත් එළිය කරන්නට මෙනි. අනතුරු ව අම්මා ඉඳිආප්ප සාදයි. මම එසැනින් ම අවදි වී චිම්නි ලාම්පුව දල්වා ගෙන පාඩම් කරමි. තාත්තා බොහෝ විට අම්මාට උදවු කිරීම සඳහා අවදි වුවත් අම්මා තාත්තාට පවසන්නේ ගල් වැඩපළේ මහන්සි වී වැඩ කරන නිසා විවේක ගන්නා ලෙස ය. නංගී ද අවදි වී පාඩම් කර අම්මා අසලින් වාඩි වෙයි. අම්මා ඉඳිආප්ප තට්ටුවලින් ගලවා වට්ටියකට දමයි. නංගී ඒවා ගණන් කර කඩවලට ලබා දීම සඳහා වෙන වෙන ම කූඩවල අසුරයි.

උදෑසනින් ම පාසල් යෑම සඳහා සූදානම් වන නංගීත් මමත් බොහෝ විට උදේ ආහාරය සඳහා හීල්බත් කන්නෙමු. 'හීල්බත්' යනු පෙර දින රැයේ පිසූ බත් ය. අපේ ගෙදර ආහාර නාස්ති වනු මා දැක නැත. හීල්බත් නොතිබුණු විටෙක අම්මා සාදන ඉඳිආප්ප පොල් සම්බල සමග කන්නෙමු.

දින පතා ම වාගේ පාසල අසල කඩයට ඉඳිආප්ප කූඩය දී යන්නේ මා විසිනි. තාත්තා ගල් වැඩපළට යන විට අනෙක් කඩවලට ඉඳිආප්ප බෙදා දෙයි.

පාසලේ ශිෂ්‍ය නායකයෙකු වන මම ඒ වගකීම් ද නොපිරිහෙළා ඉටු කරමි. මම ඉගෙනීම් කටයුතු හොඳින් සිදු කරන නිසා නංගී ද ඇයගේ ඉගෙනීම් කටයුතු සාර්ථක ව කර ගැනීමට වෙහෙසෙයි.

අම්මා සහ තාත්තා ඉතා දුක් මහන්සියෙන් අප ජීවත් කර වීමට ගන්නා වෙහෙස අපි දනිමු. ඒ නිසා හොඳින් ඉගෙන ගෙන හොඳ රැකියාවක් කිරීම අප දෙදෙනාගේ ම බලාපොරොත්තුවයි. පාසලේ ගුරුවරු ද සැම විට ම අප දෙදෙනා අගය කරති. සැම වසරක ම වාගේ වාර විභාගවල දී නංගීත් මමත් පන්තියේ පළමුවෙනියා වන්නෙමු. ඒ ගැන අම්මාට සහ තාත්තාට ඇත්තේ මහත් වූ ආඩම්බරයකි.

අම්මාගේ ගෙදර දොර සකසුරුවම වෙසෙසින් ම අගය කළ යුත්තකි. උදෑසන ඉඳිආප්ප සාදන අම්මා අප සැම නිවසින් පිටත් වූ පසු ගෙදර දොර කටයුතු නිම කර එළවළු වගා කරයි. ගෙදරට අවශ්‍ය එළවළු ගෙවත්තෙන් ම සපයා ගැනීමට වෙහෙස දරන ඇය දඹල, වම්බටු, වට්ටක්කා, මෑකරල් ආදිය වගා කරයි. අපට අවශ්‍ය කොටස තබාගෙන ඉතුරු ඒවා කඩයට දී අමතර ආදායමක් ද ලබා ගනියි. දින පතා ම වාගේ එළවළු පාත්තිවලට වතුර දමන්නේ මා යි. නංගී කුස්සියේ උයන පිහින වැඩ සඳහා අම්මාට උදවු වෙයි. ගල් වැඩපළේ වැඩ නිම කර තාත්තා නිවසට ගොඩ වෙන්නේ බිම් කරුවල වැටෙන විට ය. ගල් කඩන මිටියට තාත්තාගේ අත්වල කරගැට එයි. කුප්පි ලාම්පුව තබා ගෙන අම්මා, තාත්තාගේ අත්වල තෙල් ගාන අවස්ථා මම දැක ඇත්තෙමි. ඒ සැම විටක දීත් මම කෙසේ හෝ තවත් උනන්දුවෙන් පාඩම් වැඩ කර ජීවිතය ජයගත යුතු බවට අදිටන් කර ගත්තෙමි.

වසර කිහිපයක් ගත විය. මම අ.පො.ස. (සා.පෙ.) විභාගයට මුහුණ දුන්නෙමි. මාස කිහිපයකින් පසු ව විභාග ප්‍රතිඵල නිකුත් විය. මා සැම විෂයයකට ම විශිෂ්ට සාමාර්ථ ලබා ගෙන විභාගය ඉතා උසස් ලෙස සමත් වී තිබුණි. මා හට සතුට දරාගත නොහැකි තරම් ය. විදුහල්පතිතුමා පාසලේ උදෑසන රැස්වීමේ දී "නිපුණගේ මනා කැපවීම, උනන්දුව සහ ඉතා හොඳින් ඉගෙනීම් කටයුතුවල නිරත වීම නිසා මෙලෙස විශිෂ්ට ප්‍රතිඵලයක් ලැබුණු බවත්, පාසලට මෙවන් ප්‍රතිඵලයක් ලබා දුන් පළමුවෙනියා නිපුණ දම්සර බවත් ඒ හේතුවෙන් පාසලට ලබා දුන් කීර්තිය ඉතා වටිනා බවත්" ප්‍රකාශ කළේ ය.

අම්මාට සහ තාත්තාට ද එදින පාසලට පැමිණෙන ලෙසට දන්වා තිබුණි. විදුහල්පතිතුමා ගුරුවරු අම්මාටත් තාත්තාටත් ඔවුන්ගේ සතුට ප්‍රකාශ කර සුබ පැතූහ. ඒ දෙදෙනා ඒ සුබ පැතුම් පිළිගත්තේ දෑත් එක් කර ආචාර කිරීමෙනි.

අම්මාත් තාත්තාත් ගුරුවරුන්ට ආචාර කරන විට අම්මාගේ දෑසින් කඳුළු වැටෙනු මම දුටුවෙමි. ඒ සතුටු කඳුළු බව මම දන්නෙමි.

1. නිපුණ දම්සර ඉගෙන ගන්නේ කුමන ශ්‍රේණියේ ද ?

හය වන ශ්‍රේණියේ.

2. අම්මා උදෑසන අවදි වී සිදු කරන්නේ කුමක් ද ?

ලිප එළිය කර ඉඳිආප්ප සාදයි.

3. නිපුණ සහ නංගී හොඳින් ඉගෙන ගැනීමට උත්සාහ ගන්නේ ඇයි ?

අම්මා සහ තාත්තා ඉතා දුක් මහන්සියෙන් ජීවත් කර වීමට ගන්නා වෙහෙස දන්නා නිසා.

4. නිපුණ විභාගය සමත් වීමට හේතුව ලෙස විදුහල්පතිතුමා ප්‍රකාශ කළේ කුමක්ද ?

නිපුණගේ මනා කැපවීම, උනන්දුව සහ ඉතා හොඳින් ඉගෙනීම් කටයුතුවල නිරත වීම

## ළමා ගීතවලට සවන් දීම

03. පහත සඳහන් ගීතයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. ගුරුවරයා සමඟ සිසුන් තාල තබමින් ගීතය ගායනා කරන්න. මෙහි දී ගීතයට අනුව වින්දනාත්මක ප්‍රතිචාර දැක්වීමට සිසුන් යොමු කරන්න. උදා : අත්පුඩි ගැසීමෙන්/තාලම්පට භාවිතයෙන්/ ආදේශ භාණ්ඩ භාවිතයෙන්

ඈත මෑත සුවඳ දී සැලී
නේක නේක හැඩ රුවින් මැවී
පාට පාට මල් වගේ පිපී
යාළු යාළු පොඩි ළමයි අපි //

ල ල ල ලා . . . ////

උදෑසනක උදාගිරක අරුණ කිරණ අපි
කඩා හැලෙන දිය දහරක පිපෙන බුබුළු අපි
සදාහරිත තුරු ගොමුවක සලිත ළපලු අපි
පාට පාට මල් වගේ පිපී
යාළු යාළු පොඩි ළමයි අපි //

සඳ ඇති රැය මිහිර විඳින තරු පිරිවර අපි
දේදුන්නක පාට සදන තරු පිරිවර අපි
පාට පාට මල් වගේ පිපී
යාළු යාළු පොඩි ළමයි අපි //

ඈත මෑත . . .



පද රචනය : ආචාර්ය, සෝමරත්න දිසානායක

1. ගීතයෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද?

පොඩි ළමයින් ගැන.

2. ළමයින් උපමා කොට හෝ සමාන කර ඇති අවස්ථා උපුටා දක්වන්න.

උදෑසනක උදාගිරක අරුණ කිරණ

කඩා හැලෙන දිය දහරක පිපෙන බුබුළු

සදාහරිත තුරු ගොමුවක සලිත ළපලු

සඳ ඇති රැය මිහිර විඳින තරු පිරිවර

දේදුන්නක පාට සදන තරු පිරිවර අපි

## ළමා කවිවලට සවන් දීම

04. පහත සඳහන් කවි පෙළට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

ඉර උදා වෙන්න ට
පළමු ව නැඟිට සිහි කොට
අලසකම් දුරු කොට
කරන් වැඩපල දියුණු වන්නට

ගෙදොර අතු ගෑමෙන
මූණ කට සෝදා ගෙන
ඔළුව පීරා ගෙන
අකුරු පාඩම් කරනු සතුටින

අතපය සෝදා ගෙන
නරක කෑමක් නොම ගෙන
හොඳ දෙයක් කෑ මෙන
සැරසෙන්න පාසලට යන මෙන

තම දෙවියන් නැමද
මව්පිය දෙදෙන දැක වැඳ
ගුරුන් වෙත ගොස් වැඳ
අකුරු නිසි ලෙස ඉගෙන ගනු සොඳ

තම පොත්පත් රැගෙන
නියම තැන්වල ඉඳගෙන
ගෝසා නොකරමි න
කරනු පාඩම් සිතට ගනිමින

පාසලෙහි තැන තැන
නොයන් දුවමින් බලමින
දඟ නොකර ඉඳ ගෙන
ගුරුන් කී දෙය කරන් එලෙසින

අනුන්ගේ පොත් පත්
නාදිනු නොගනු කිසිවක්
උවමනා කළ හොත්
කියා ඉල්ලා ගැනුම යහපත්

සිඟා කාගෙන වත්
කිලුටු වැරහැලි ඇඳවත්
බිම වැටී ඉඳ වත්
මහත් සැප වෙයි ඉගෙන ගත හොත්

1. කවියේ සඳහන් හොඳ පුරුදු කිහිපයක් ලියන්න.

ඉර උදා වෙන්න ට පළමු ව නැගිටින්න

අලසකම් දුරු කොට වැඩපල කරන්න.

ගෙදොර අතු ගාන්න.

අකුරු නිසි ලෙස ඉගෙන ගන්න.

මව්පියන්ට වැඳ පාසල් යාම.

ගුරුන් කී දෙය එලෙසින් ම කිරීම.

ගෝසා නොකරමින් සිතට ගනිමින් පාඩම් කරන්න.

පාසලේදී දඟ නොකර ඉඳීම.

අනුන්ගේ පොත් පත් කිසිවක් නාදින්න. නොගන්න.

උවමනා කළ දෙයක් වෙතොත් කියා ඉල්ලා ගන්න.

2. කවිය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

සිරිත් මල්දම

3. එම ග්‍රන්ථය රචනා කර ඇත්තේ කවුරුන් විසින් ද?

එල්. එම්. ද සිල්වා ගුරු මුහන්දිරම්තුමා

## නිදහසේ කතන්දර පැවසීම

05. පහත සිද්ධියෙන් පටන් ගෙන කුඩා කතන්දරයක් ගොඩ නගන්න.

- විශාල කළුගල් ගොඩක් මිදුලේ පසෙකින් පෙනෙන්නට ඇත. ඒ අසලින් නයෙක් ඇදී යයි.

එම සිද්ධිය මමත් නංගීත් දුටුවෙමු. මමත් නංගි අම්මට තාත්තට කතා කළෙමු. එම දෙදෙනා හැකි ඉක්මනින් මිදුලට පැමිණියෝ ය. අපේ වත්ත පහල අඳුකොළ තිබෙන බව තාත්තාට මතක් වූයේ ය.

තාත්තා හැකි ඉක්මනින් වත්තට ගොස් අඳුකොළ රැගෙන ආවේ ය. ඉන්පසු තාත්තා අඳුකොළ මිදුල මැදින් තැබුවේ ය. ටික වේලාවකින් නයා වත්ත පහළට ඇදී ගියේ ය.

ගල් ගොඩවල් ආදිය වත්තේ ඇති විට මෙවැනි සර්පයින් පැමිණිය හැකි බව තාත්තා අපට පැහැදිලි කර දුන්නේ ය. අපි එදිනම සියලු දෙනා එකතු වී වත්ත සුද්ද කළෙමු. කළුගල් ගොඩේ සිටි පත්තෑයන් වැනි විෂ සහිත සතුන් ද අපට දැකගත හැකි විය.

විසකුරු වුවත් අපට මෙන්ම ඔවුන්ට ද ජීවත් වීමට අයිතියක් ඇත. පරිසරයේ පැවැත්මට ඔවුන්ට ද දායක වේ. සර්පයා අපට පාඩමක් කියාදුන්නේ ය.

-අමාෂා හංසමාලි-

**Grade 5 - 2022**

## මාතෘකාවකට අදාළ ව කතා කිරීම

06. පහත එක් මාතෘකාවක් තෝරාගෙන මාතෘකාවට අදාළ ව කතාවක් කරන්න.

- මා කැමති ම කතා පොත
- රූපවාහිනිය
- වැඩිහිටියන්ට සලකමු
- මගේ ගෙවත්ත
- මා ගිය විනෝද ගමනක්

උදා : මා කැමති ම පොත

- මා කියවූ පොත් අතරින් මා වඩාත් ම කැමති ගඟ අද්දර කැලේ නම් පොතට යි.
- එහි කතුවරයා වන්නේ සෝමවීර සේනානායක මහතා යි.
- ගැමි පරිසරයක ජීවත් වන විට ලැබෙන බොහෝ අත්දැකීම් මේ කතා පොතේ ඇතුළත් කර තිබෙනවා.
- පහුරක ගිය ගමන, වැස්සි සහ පැටියා සොයා ගත් ආකාරය මගේ සිත් ගත් අවස්ථා යි.
- යහළුවන් සමඟ එකමුතුකමින් ජීවත් වීමේ වටිනාකම මෙම පොත කියවීමෙන් මට පැහැදිලි වුණා.

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ